 

## ඉන්දියා – ශ්‍රී ලංකා ආර්ථික හවුල්කාරීත්ව දැක්ම:

## සම්බන්ධකතාවය ප්‍රවර්ධනය කරමින්, සෞභාග්‍යය උත්ප්‍රේරණය කරමින්

ඉන්දීය අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා සහ ශ්‍රී ලංකා ජනාධිපති අතිගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් 2023 ජූලි 21 වන දින නව දිල්ලි හිදි ඵලදායි සහ ප්‍රතිඵල වෙත යොමු වූ සාකච්ජාවන් පවත්වන ලදී. ශ්‍රී ලංකාව මුහුණ දුන් ආර්ථික දුෂ්කරතාවයන් ජයගැනීමෙහිලා ඉන්දියා – ශ්‍රී ලංකා හවුල්කාරීත්වය ශක්තියක් වූ බව නායකයන් දෙපළ ප්‍රකාශ කළ අතර ශ්‍රී ලංකා ජනාධිපතිතුමා ඉන්දියාව විසින් ශ්‍රී ලංකා රජයට සහ ජනතාවට ලබා දුන් කාලීන, පෙර නොවූ විරූ සහ තීරණාත්මක සහය විශේෂයෙන් අගය කළේය.

2. නායකයන් දෙපළම ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය, ස්ථාවරත්වය සහ ආර්ථික ප්‍රතිසාධනය සම්බන්ධයෙන් ඔවුන්ගේ දැඩි කැපවීම සහ විශ්වාසය අවධාරණය කළ අතර රටෙහි සෑම පෙදෙසකම ශ්‍රී ලංකා සමාජයේ සියළු කොටස්වලට ප්‍රතිලාභ ගෙන දෙන මෙන්ම සංහිඳියාව ප්‍රවර්ධනය කරන තිරසාර, සාධාරණ සහ ස්ථායි වර්ධනයක් සඳහා ඉන්දියාවේ අඛණ්ඩ සහයෝගයේ සහ ආයෝජනවල වැදගත්කම අවධාරණය කළහ.

3. ඉන්දියාව දිගු කලක් තිස්සේ පවත්වාගෙන යන වේගවත් ආර්ථික වර්ධනය සහ තාක්ෂණික දියුණුව සමග එක් වූ ශ්‍රී ලංකාවේ වත්මන් ස්ථායිකරණ සහ ආර්ථික ප්‍රතිසාධන අවධිය, යළි ගොඩනැගීම සහ වර්ධනය දෙරට අතර වඩා සමීප සහ ගැඹුරු ද්විපාර්ශවික ආර්ථික හවුල්කාරීත්වයක් නිර්මාණය කර ගැනීමට මෙන්ම ඉන්දියානු සාගර කලාපයේ වර්ධනය ඉහළ නැංවීමට සුවිශේෂී අවස්ථාවක් ලබා දෙන බවට නායකයන් දෙපළ එකඟ වූහ. එසේම, ශිෂ්ටාචාරමය බැඳීම්,

භූගෝලීය ආසන්නතාවය, සංස්කෘතික බැඳීම සහ දෙරට ජනතාව අතර පවතින ඉපැරණි හොඳහිත විසින් පිරිනමන අසමසම වාසි අවධාරණය කළ නායකයන් දෙපළ පොදු සහ තිරසාර ආර්ථික සෞභාග්‍යයක් ගෙන එන අයුරින් පවත්නා සහක්‍රියාවන් සහ අනුපූරකතාවයන් සවිමත් කිරීමට ඔවුන්ගේ ප්‍රයත්නය ද තහවුරු කළහ.

4. මේ සඳහා ප්‍රධානම සබලකාරකය වශයෙන් සියලු පැතිකඩ ඔස්සේ සම්බන්ධකතාවය ප්‍රවර්ධනය කිරීමේ සහ ශක්තිමත් කිරීමේ ඉමහත් වැදගත්කම නායකයන් දෙපළ විසින් අවධාරණය කරන ලදී. ඒ අනුව, නායකයන් දෙපළ විසින් පහත තීරණයන්ට එළඹෙන ලදී.

## I. සමුද්‍රීය සම්බන්ධකතාවය

a. අන්‍යෝන්‍ය අවබෝධය අනුව කලාපීය ලොජිස්ටික් කටයුතු සහ නාවික කටයුතු සවිමත් කිරීමේ අරමුණින් කොළඹ, ත්‍රිකුණාමලය සහ කන්කසන්තුරෙයි වරායන් සහ ඒවායේ ලොජිස්ටික් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමෙහිලා සහයෝගයෙන් කටයුතු කිරීම

b. ඉන්දියාවේ නාගපට්ටිනම් සහ ශ්‍රී ලංකාවේ කන්කසන්තුරෙයි අතර මගී බෝට්ටු සේවා නැවත ආරම්භ කිරීම සහ රාමේෂ්වරම් සහ තලෙයි මන්නාරම සහ අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වූ වෙනත් ස්ථාන අතර බෝට්ටු සේවා කඩිනමින් නැවත ආරම්භ කිරීම

## II. ගුවන් සම්බන්ධකතාවය

a. යාපනය සහ වෙන්නායි අතර ගුවන් ගමන් නැවත ආරම්භ කිරීම දෙරට ජනතාව අතර සබඳතා ඉහළ නංවා තිබෙන බවට නිරීක්ෂණය කළ අතර එය තවදුරටත් කොළඹ දක්වා ව්‍යාප්ත කිරීමට මෙන්ම වෙන්නායි සහ ත්‍රිකුණාමලය, මඩකලපුව සහ ශ්‍රී ලංකාවේ වෙනත් ගමනාන්ත අතර සම්බන්ධකතා ඇති කිරීම සඳහා ඇති අවස්ථාවන් සොයා බැලීම

b. ජනතාවට වැඩි ආර්ථික ප්‍රතිලාභ ලබා දීම සඳහා පලාලි ගුවන් තොටුපළ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම ඇතුළු සිවිල් ගුවන් සේවා

ක්ෂේත්‍රය තුළ ආයෝජන සහ සහයෝගීතාවය දිරි ගැන්වීම සහ ශක්තිමත් කිරීම

## III. විදුලිබල සහ බලශක්ති සම්බන්ධකතාවය

a. ශ්‍රී ලංකාවට 2030 වන විට විදුලිබල අවශ්‍යතාවයෙන් 70%ක් පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් උත්පාදනය කිරීමේ ඉලක්කය සපුරාගැනීමට අවස්ථාව සලසමින් පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සඳහා සහයෝගීතාවය පිළිබඳ අවබෝධතා ගිවිසුම සම්බන්ධයෙන් නිගමනයකට එළඹීම අක්වෙරළ සුළං සහ සූර්ය බලශක්තිය ඇතුළු ශ්‍රී ලංකාවේ සැලකිය යුතු පුනර්ජනනීය බලශක්ති විභවතාවය සංවර්ධනය කරනු ඇති බවට එකඟ විය.

b. ශ්‍රී ලංකාව සහ BBIN රටවල් ඇතුළු අනෙකුත් කලාපීය රටවල් අතර ද්විදිශානතික විදුලිබල වෙළඳාමකට අවස්ථාව විවර කිරීම සඳහා ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ඉහළ ධාරිතාවයක් සහිත විදුලිබල ජාල අන්තර් සම්බන්ධතාවයක් ස්ථාපිත කිරීම. මෙය ශ්‍රී ලංකාවේ විදුලිබල පිරිවැය පහත හෙළනු ඇති අතර ම ශ්‍රී ලංකාවට අගනා සහ විශ්වාසදායි විදේශ විනිමය මූලාශ්‍රයක් ද නිර්මාණය කරනු ඇත.

c. ශ්‍රී ලංකාවේ විදුලිබල උත්පාදනයේ පුනර්ජනනීය බලශක්ති මුසුව ඉහළ නැංවීමේ අරමුණින් සාම්පූර් සූර්ය බලාගාර ව්‍යාපෘතිය සහ LNG යටිතල පහසුකම් සම්බන්ධයෙන් එළඹ ඇති අවබෝධතාව ක්‍රියාත්මක කිරීම සහ නව්‍ය තාක්ෂණයන් හරහා හරිත හයිඩ්‍රජන් සහ හරිත ඇමෝනියා යන අංශයන් හි සහයෝගීතාවයට පවතින අවස්ථාවන් සොයා බැලීම

d. ත්‍රිකුණාමලය ටැංකි සංකීර්ණය සම්බන්ධයෙන් දැනට පවතින සහයෝගීතාවය ත්‍රිකුණාමලය ප්‍රදේශයේ අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායි සහයෝගිතා ව්‍යාපෘතීන් සංවර්ධනය කිරීමට අපගේ ප්‍රයත්නය පිළිඹිබු කරන අතර අන්‍යෝන්‍ය අවබෝධය මත පදනම්ව ත්‍රිකුණාමලය ජාතික සහ කලාපීය කාර්මික, බලශක්ති සහ ආර්ථික ක්‍රියාකාරකම්හි මධ්‍යස්ථානයක් ලෙස තවදුරටත් සංවර්ධනය කිරීම

e. ශ්‍රී ලංකාවට දැරිය හැකි සහ විශ්වාසය තැබිය හැකි බලශක්ති සම්පත් සැපයුමක් සහතික කිරීමේ අරමුණින් ඉන්දියාවේ දකුණු ප්‍රදේශයේ සිට ශ්‍රී ලංකාවට බහු-නිෂ්පාදන පෙට්‍රෝලියම් නලයක් ඉදිකිරීම සඳහා සහයෝගයෙන් කටයුතු කිරීම

f. ශ්‍රී ලංකාවේ ප්‍රතිස්‍රෝතික (upstream) පෙට්‍රෝලියම් ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ මුහුදු ප්‍රදේශයන් හි අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වූ හයිඩ්‍රොකාබන් ගවේෂණ සහ නිෂ්පාදන සිදු කිරීම

## IV. වෙළඳාම, ආර්ථික සහ මූල්‍ය සම්බන්ධකතාවය

a. ද්විපාර්ශ්වික වෙළඳාමේ සහ ආර්ථික තියැලීම්වල වැදගත්කම කොවිඩ් වසංගතය සහ ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය අතරතුර මැනවින් ප්‍රදර්ශනය වූ අතර ප්‍රතිපත්තිමය සංගතභාවය, ව්‍යාපාර කිරීමේ පහසුව ප්‍රවර්ධනය කිරීම සහ එකිනෙකාගේ ආයෝජකයන්ට සාධාරණව සැලකීම යනාදි කරුණු ද ඇතුලත්ව අන්‍යෝන්‍ය ආයෝජන සඳහා අවස්ථාව සැලසීමට එකඟ විය.

b. ශ්‍රී ලංකාවේ රජයට අයත් ආයතන තිරායෝජනයේ දී සහ ශ්‍රී ලංකාවේ විවිධ අංශයන් හි නිෂ්පාදන/ආර්ථික කලාපයන් හි ඉන්දියාවේ ආයෝජන සඳහා පහසුකම් සැලසීම

c. නව සහ ප්‍රමුඛ ක්ෂේත්‍රයන් හි ද්විපාර්ශ්වීය වෙළඳාම සහ ආයෝජන පුළුල් ලෙස ඉහළ නැංවීමේ අරමුණින් ආර්ථික සහ තාක්ෂණික සහයෝගිතා ගිවිසුම පිළිබඳ සාකච්ඡා ඇරඹීම

d. දෙරට අතර වෙළඳ පියවීම් සඳහා ඉන්දියානු රුපියල භාවිතා කිරීමේ තීරණය වඩා ශක්තිමත් සහ අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායි වාණිජ සබඳතා ස්ථාපිත කර ඇති බව නිරීක්ෂණය කළ අතර ව්‍යාපාර සහ පොදු මහජනතාව අතර වෙළඳාම සහ ගනුදෙනු තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා UPI පදනම් කරගත් ඩිජිටල් ගෙවීම් භාවිතා කිරීමට එකඟ විය.

e. ඉන්දියාවේ සීඝ්‍ර ඩිජිටල්කරණය ඉන්දියාවේ ආර්ථික සංවර්ධනය සහ පාලනය යන දෙඅංශයේම සිදු වෙමින් පවතින පරිවර්තනීය වෙනස්කම් සඳහා වැදගත් බලපෑම් ගුණකයක් වන බව සහ ඉන්දියාවේ ඩිජිටල් පොදු යටිතල පහසුකම් ශ්‍රී ලංකාවේ ජනතාව සඳහා පුරවැසි කේන්ද්‍රීය සේවාවන් ඵලදායිව සහ කාර්යක්ෂමව ලබා දීම සඳහා ශ්‍රී ලංකාවේ අවශ්‍යතාවයන් සහ ප්‍රමුඛතාවයන්ට අනුව ප්‍රයෝජනයට ගැනීමට එකඟ විය.

## V. දෙරට ජනතාව අතර සබඳතා

a. සංචාරක කර්මාන්තය ඉහළ නැංවීම සඳහා ඉන්දියාවේ බෞද්ධ සිද්ධස්ථාන, රාමායණය හා සම්බන්ධ ස්ථාන මෙන්ම බෞද්ධ, හින්දු සහ ශ්‍රී ලංකාවේ වෙනත් ආගම් හා සම්බන්ධ ඓතිහාසික ස්ථාන පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම සහ ඒවා ජනතාව අතරට ගෙනයාම

b. ශ්‍රී ලංකාවේ අවශ්‍යතා සහ ප්‍රමුඛතාවයන්ට අනුකූලව ශ්‍රී ලංකාවේ නව උසස් අධ්‍යාපන ආයතන සහ කුසලතා විශ්ව විද්‍යාල ස්ථාපනය කිරීම යනාදිය හරහා දෙපාර්ශවයේ අධ්‍යාපන ආයතන අතර සහයෝගීතාවය ඉහළ නංවාගත හැකි ආකාර සොයා බැලීම

c. කෘෂිකර්මාන්තය, ජලජීවී වගාව, තොරතුරු තාක්ෂණය, ව්‍යාපාර, මූල්‍ය සහ කළමනාකරණය, සෞඛ්‍ය සහ ඖෂධ, ජෛවී සහ සමුද්‍රීය විද්‍යා, සාගර විද්‍යාව, අභ්‍යවකාශ භාවිතින් මෙන්ම ඉතිහාසය, සංස්කෘතිය, භාෂා, සාහිත්‍යය, ආගමික අධ්‍යයන සහ වෙනත් මානව ශාස්ත්‍ර වැනි අන්‍යෝන්‍ය වශයෙන් උනන්දුවක් දක්වන ක්ෂේත්‍රයන්හි පර්යේෂණ සහ අධ්‍යාපන ආයතන අතර සහයෝගීතාවය ව්‍යාප්ත කිරීම

d. ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාවේ ආර්ථික වර්ධනය සහ සෞභාග්‍යය ඉහළ නංවමින් සහ දෙරට අතර සහශ්‍ර වර්ෂ ගණනාවක් ඉපැරණි සම්බන්ධතාවය තවදුරටත් ශක්තිමත් කරමින් ත්‍රිකුණාමලය සහ කොළඹ වරායන් වෙත භූමි ප්‍රවේශය සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර භූමි සම්බන්ධකතාවය ස්ථාපිත කිරීම. මෙවන්

සම්බන්ධකතාවයක් සඳහා ශක්‍යතා අධ්‍යයනයක් නුදුරු දිනයක දී සිදු කරනු ඇත.

5. නායකයන් දෙපළ දිගු කාලීන දිශානතිය සහ දෙරටෙහි ම මෙන්ම වඩා පුළුල් කලාපය තුළ වර්ධනය සහ සෞභාග්‍යය උදෙසා ද්විපාර්ශවීය සහයෝගීතාවයට තීරණාත්මක ජවය ලබා දෙන පමණක් නොව ඉහළ නංවන ලද අන්‍යෝන්‍ය විශ්වාසය මත පදනම් වූ ගතික ඉන්දියා – ශ්‍රී ලංකා සම්බන්ධතාවයක අනාගත දිශානතිය ද නිර්මාණය කරන මෙම පොදු දැක්ම සාක්ෂාත් කරගැනීම කඩිනම් කිරීම සඳහා අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දුන්හ.

*****************